**කොළඹ දිස්ත්‍රික් ගොවිජන සේවා කාරක සභාව - 2022**

**--------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** 2022 වර්ෂයට අදාළව කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 කට අදාළව තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත. ඒ සඳහා හේතු වූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05ක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සියල්ල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර අදාල කරගත් ගිණුම්කරණ සංකල්ප කීපයක් පමණක් අනාවරණය කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව පිළියෙල කිරිමට කටයුතු කරන බව කොස්ගම හා කහතුඩුව ගොවිජන සේවා කාරක සභා දන්වා ඇති අතර කෝට්ටේ, හෝමාගම හා පාදුක්ක ගොවිජන සේවා කාරක සභා විසින් පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 21 (ඇ) ඡේදය ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභා 09 විසින් ශුද්ධ වත්කම්/ස්කන්ධයේ වෙනස්වීමේ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලය විසින් හඳුන්වා දුන් මූල්‍ය ප්‍රකාශන ආකෘති තුල එය ඇතුළත්ව නොමැති බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක් ගොවිජන සේවා කාරක සභාවක 2022 දෙසැම්බර් 31 දිනට තොග සත්‍යාපන වාර්තාව | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | තොග අගයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුව විවිධ තොගවල මුළු එකතු වටිනාකම රු.793,297 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව එම තොගයන්ට අදාළ වටිනාකම ලෙස ප්‍රමාණාත්මක තොග ගිණුම අනුව වටිනාකම වශයෙන් එකතුව රු.1,540,571ක් සඳහන් කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂ අවසානයේ පැවති තත්‍ය තොග අගය දක්වා නොතිබීම මත භෞතිකව නොමැති වටිනාකම රු.747,274 ක තොගයක් මූල්‍ය තත්ත්ව විස්තරයේ ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | | |
| (ආ) | ගොවිජන සේවා කාරක සභාවක ආරම්භක සමුච්චිත අරමුදල් ශේෂය වූ රු.3,814,822 කට සමාලෝචිත වර්ෂයේදි රු.581,366ක් ගැලපීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.4,396,189ක් ලෙස සමුච්චිත අරමුදලේ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණද එකී ගැලපීම්වලට අදාල ගණුදෙනු, සිද්ධින් හා තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | සමුච්චිත අරමුදලට සිදුකරන ලද ගැලපීම සඳහා අනුමත කරන ලද ජර්නල් සටහන් පවත්වාගත යුතුය |

**1.3.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 04ක ගිණුම් විෂයයන් 12 කට අදාලව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර ශේෂයෙහි එකතුව රු.972,052ක නොසැසඳීම් පැවතුණි. | ගොවිජන සේවා කාරක සභා 02ක් ඉදිරියේදි එම තොරතුරු ඉදිරිපත් කරන බව හා අනෙක් ගොවිජන සේවා කාරක සභා පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | නොසැසඳීම්වලට අදාල හේතු පරික්ෂාකර නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක් ගොවිජන සේවා කාරක සභාවක වසර 06කට පෙර සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුම් හර ශේෂය රු.222,625ක් හා රු.260,839ක අවිනිශ්චිත ගිණුමක බැර ශේෂයක් සහ තවත් ගොවිජන සේවා කාරක සභාවක වසරකට පෙර සිට ඉදිරියට ගෙන එන රු.254,065ක අවිනිශ්චිත ගිණුම් හර ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී සොයා බලා නිරවුල් කිරිමට කටයුතු කරන බව කොස්ගම ගොවිජන සේවා කාරක සභාව විසින් දන්වා තිබුණු අතර අනෙක් ගොවිජන සේවා කාරක සභා පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | මෙම අවිනිශ්චිත ගිණුම් ශේෂයන් වසර ගණනක් සිට පැවත එන බැවින් මෙම අවිනිශ්චිත ගිණුම් ශේෂයන්ට හේතු කඩිනමින් සොයාබලා ගිණුම් නිවැරදිකිරිමට කටයුතු කළයුතුය. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 08 ක වත්කම් රු.25,194,349කට අදාළව ස්ථාවර වත්කම් ලේඛන, ශේෂ සනාථකිරිම් සහ කාල විශ්ලේෂණ වැනි සාක්ෂි නොතිබු අතර ගොවිජන සේවා කාරක සභා 04 කට අදාළ වගකිම් රු.2,737,378ක් සඳහා ශේෂ සනාථකිරිම්, කාල විශ්ලේෂණ හා ඇප තැන්පතු ලේඛන වැනි සාක්ෂි නොතිබීම හේතුවෙන් එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කළ නොහැකි විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | වත්කම් හා වගකිම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරිමට කටයුතු කළ යුතුය. |

### 1.4 නීතී, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීතී, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| (i) 41 වගන්තිය | කොළඹ දිස්ත්‍රික් ගොවිජන සේවා කාරක සභා සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රුස්විම් එකක් පමණක් පවත්වා තිබුණි. | අවම වශයෙන් කාර්තුවකට එක් රැස්විමක්වත් පැවැත්විය යුතුවේ. | විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ii) 18 (4) උප වගන්තිය | විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින් විගණනය ගාස්තු සඳහා වූ ගිණුම් ඉන්වොයිස් පත්‍රයේ දින සිට දින තිහක් ඇතුළත ගෙවා බේරුම් කළ යුතුය යන්න සඳහන් වුවත් කොස්ගම ගොවිජන සේවා කාරක සභාව විසින් 1996 සිට 2013 දක්වා රු.82,829ක් සහ මාලබේ ගොවිජන සේවා කාරක සභාව විසින් 1998 සිට 2008 දක්වා රු.50,628ක්ද, විගණන ගාස්තු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | විගණන ගාස්තු ගෙවීමට කටයුතු කරන බව කොස්ගම ගොවිජන සේවා කාරක සභාව විසින් දන්වා තිබුණු අතර අනෙකුත් ගොවිජන සේවා කාරක සභා පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | විගණන පනත ප්‍රකාරව විගණන ගාස්තු ගෙවීම් සිදු කළ යුතුය. |
| (iii) 38 (1) (ඉ) උප වගන්තිය | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවක් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දිය යුතු වුවත් හෝමාගම සහ මාලබේ ගොවිජන සේවා කාරක සභාව 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාද, මහරගම ගොවිජන සේවා කාරක සභාව 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වාද කොස්ගම ගොවිජන සේවා කාරක සභාව 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වාද වූ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාවේ කෙටුම්පත් වාර්තා සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | විගණන පනත ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ කෙටුම්පත් වාර්තා සඳහා පිළිතුරු ලබා දිය යුතුවේ. |
| (ආ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| (i) 14 වගන්තිය | තොරතුරු සොයාගත නොහැකි වීමෙන් අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට ගෙවිය යුතු ප්‍රවේණිය ලෙස ඉකුත් වර්ෂවලදී පිළිවෙලින් කොස්ගම, කහතුඩුව හා මහරගම ගොවිජන සේවා කාරක සභාවලට ලැබී තිබුණු රු.11,462ක්, රු.243,935ක් හා රු.9,642ක් පනතේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ උපදෙස් ඉල්ලා ඇති බව කොස්ගම ගොවිජන සේවා කාරක සභාව විසින් දන්වා තිබුණු අතර උසාවි නඩු නිමවන තෙක් නිරවුල් කළ නොහැකි බව කහතුඩුව ගො. සේ. කා. සභාව දන්වා ඇති අතර අනෙකුත් ගො. සේ. කා. ස. විසින් පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | **ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය** |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු. රෙ. 134 (3) | කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා | අභ්‍යන්තර | මුදල් |

| | | | | |
|---|---|---|---|---|
| | | කාරක සභා සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ අභ්‍යන්තර විගණන පරීක්ෂණවල විගණන වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයක් සිදු වී නොමැති බව කහතුඩුව ගො. සේ. කා. සභාව දන්වා ඇති අතර විගණනය සමග එකගවන බව කොස්ගම ගො. සේ. කා. සභාව දන්වා ඇති අතර අනෙකුත් ගො. සේ. කා. ස. විසින් පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මු.රෙ. 757 (2) (අ) | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව ලැබීමෙන් පසු එහි පිටපතක් වහාම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය යන්න දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයට අදාල ගොවිජන සේවා කාරක සභා 08 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | එම වාර්තා දිස්ත්‍රික් කාර්යාලයෙන් එවා නොමැති බව කහතුඩුව හා කොස්ගම ගො. සේ. කා. සභාව දන්වා ඇති අතර අනෙකුත් ගො. සේ. කා. ස. විසින් පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මු.රෙ. 880 හා 881 | භාණ්ඩ හා මුදල් භාරව කටයුතු කරන, චෙක්පත් අත්සන් කරනු ලබන ගොවිජන සේවා කාරක සභා 07 ක නිලධාරීන් විසින් ඇප ආඥා පනත අනුව ඇප තබා නොතිබුණි. | අදාල කටයුතු සිදු කරමින් පවතින බව කහතුඩුව හා කොස්ගම ගො. සේ. කා. සභාව දන්වා ඇති අතර අනෙකුත් ගො. සේ. කා. ස. විසින් පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2022 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 09 හි එකතුව රු.7,095,770 ක අතිරික්තයක්ද, ගොවිජන බැංකු 08 හි එකතුව රු.2,552,161 ක අතිරික්තයක්ද විය. 2021 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 09 හි එකතුව රු.4,195,335 ක අතිරික්තයක්ද, ගොවිජන බැංකු 08 හි එකතුව රු.2,603,405 ක අතිරික්තයක්ද විය.

### 2.1.1 විශ්ලේෂනාත්මක සමාලෝචනය

(i) සමාලෝචිත වර්ෂයේදී ගොවිජන සේවා කාරක සභා 09 ක රු.7,095,770 ක අතිරික්තයක් ලබාගෙන තිබූ අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේදී ගොවිජන සේවා කාරක සභා 08 ක අතිරික්තය රු.4,322,922 ක් සහ ගොවිජන සේවා කාරක සභාවක රු.127,587 ක ඌණතාවයක් වශයෙන් එකතුව රු.4,195,335 ක අතිරික්තයක් විය. ඒ අනුව අතිරික්තයේ රු.2,900,435 ක වැඩිවීමක් දක්නට විය. මෙම වර්ධනයට මහරගම, හෝමාගම, කැස්බෑව හා කොලොන්නාව ගොවිජන සේවා කාරක සභාවල අතිරික්කය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. එයට ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ ලිඛිත අවසරයක් නොමැතිව කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නඩු කටයුතුවලින් ඉවත්වීම වෙනුවෙන් හෝමාගම හා කොලොන්නාව ගොවිජන සේවා කාරක සභාවන්ට ලැබී තිබුණු පිළිවෙලින් රු. මිලියනයක් හා රු. මිලියන 0.8 ක්වූ පරිත්‍යාග ආදායමද මහරගම හා කැස්බෑව ගොවිජන සේවා කාරක සභාවල ගොඩ ඉඩම් ලේඛනයට ඇතුළත්කිරීමේ සේවා ගාස්තු ආදායමයද හේතුවිය.

(ii) ගොවිජන සේවා කාරක සභාවල මූලික කාර්යභාරයක් ලෙස පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, බීජ සහ පැළ, කෘෂි උපකරණ ඇතුළු කෘෂි කාර්මික භාණ්ඩ අලෙවි කිරීම වන අතර සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා 09 ම මුළු අලෙවියේ එකතුව රු.35,678,090 ක් විය. මුළු දළ ලාභය එකතුව රු.3,059,825ක් වූයෙන් ඒ අනුව එක් ගොවිජන සේවා කාරක සභාවක වාර්ෂික අලෙවි වටිනාකම රු.3,964,232ක් වූ අතර සාමාන්‍ය දළ ලාභය රු.339,980ක් විය.

(iii) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට ගොවිජන සේවා කාරක සභා 09 හි මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| මූල්‍ය වත්කම් | රු. |
|---|---|
| ජංගම වත්කම් | 72,603,997 |
| ජංගම නොවන වත්කම් | 44,034,421 |
| | 116,638,418 |
| **මුළු වගකීම්** | |
| ජංගම බැරකම් | 58,012,242 |
| දිගුකාලීන ණය වටිනාකම | 7,874,299 |
| සමුච්චිත අරමුදල් වටිනාකම (ශුද්ධ වත්කම) | 50,751,877 |
| | 116,638,418 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මුදල් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 03ක පවතින ජංගම බැංකු ගිණුම් 05 ක් අක්‍රිය තත්වයේ පැවති අතර එම ගිණුම්වල 2022 දෙසැම්බර් 31 දිනට රු.485,120ක ශේෂයක් පැවතුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | අක්‍රිය බැංකු ගිණුම් තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍යතාවයක් නොමැති නම් එම ගිණුම් විධිමත් අනුමැතියක් මත අවසන් කිරීමට කටයුතු කිරීම. |

**3.2 තැන්පත් ගිණුම් පිළිබඳ තොරතුරු සහ ඵලදායී ආයෝජනයක යොදවා නොතිබීම**

2022 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 09 ක් සහ ගොවිජන බැංකු 08 ක් විසින් රජයේ වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වල පැවැති ශේෂයන් සහ රජයේ බැංකුවල ඉතුරුම් හා ස්ථාවර තැන්පතු ලෙස සිදුකර ඇති ආයෝජනයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආයතනය | ඉතුරුම් තැන්පතු | ස්ථාවර තැන්පතු | ජංගම තැන්පතු | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| කාරක සභා | 3,546,003 | 23,349,580 | 54,475,288 | 81,370,871 |
| ගොවිජන බැංකුව | 14,888,944 | 9,873,108 | 1,764,285 | 26,526,337 |
| එකතුව | 18,434,947 | 33,222,688 | 56,239,573 | 107,897,208 |

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) කිසිදු පොලී ආදායමක් නොලබන ජංගම ගිණුම්වල පැවති ශේෂය රු.56,239,573 කි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | අරමුදල් වඩාත් ඵලදායි ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |
| (ආ) අඩු පොලී ආදායමක් ලබන ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර ඇති මුදල් එකතුව රු.18,434,947 කි. ඒ අනුව මුදල් ඵලදායී ලෙස යොදවා නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | අරමුදල් වඩාත් ඵලදායි ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |

## 3.3 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොස්ගම ගොවිජන බැංකුවේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරිය විසින් කර තිබූ බවට වාර්තා වූ රු.483,664 ක මූල්‍ය වංචාවලට අදාල එම නිලධාරිනියගෙන් එකි මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවද, මෙම මූල්‍ය වංචාව අනාවරණය වී වසර 08 කටත් වඩා වැඩි කාලයක් ගතව ඇතත් නිලධාරිනියට එරෙහිව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 29.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු සිදු කර නොතිබුණි. | මූලික විමර්ශනයක් සිදුකර ඇති බවද මුදල් අයකර ගැනිමෙන් පසු ගිණුම් වාර්ථා නිවැරදි කරන බව. | අභ්‍යන්තර විගණන වාර්තා මගින් හඳුනාගෙන තිබුණු මූල්‍ය වංචා සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | කෝට්ටේ ගොවිජන සේවා කාරක සභාවේ වාර්තා අනුව අනාවරණය වී තිබූ රු.764,838ක තොග ඌණතාවයෙන් රු.81,623ක් වගකිවයුතු නිලධාරින්ගෙන් අයකරගෙන ඇතත්, ඉතිරි තොග ඌණතාවය වන රු.683,215 ක් අයකරගෙන නොතිබුණි. තවද, ගොවිජන බැංකුවේ සිදුවී තිබුණු රු.564,741ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 පරිදි කටයුතු කර වගකිව යුතු නිලධාරින්ගෙන් එම මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණු අතර, රු.444,741ක් ලෙස එම මූල්‍ය වංචාවේ වටිනාකම පමණක් ගිණුම්වල දක්වා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | අභ්‍යන්තර විගණන වාර්තා මගින් හඳුනාගෙන තිබුණු මූල්‍ය වංචා සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09යට අදාලව 2022 වර්ෂයේ මහකන්නයේ වි වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 11,516ක් වුවද වගාකල කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 9,227 විය. පුරන්ව ඇති කුඹුරු ඉඩම්වලින් වගාකල හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 1887ක් වන අතර ඉන් වී වගාකල කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 348 ක් වේ. ඒ අනුව සමස්තයක් ලෙස වී වගාකල හැකි | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | වී වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය වී වගාව සඳහා යොදා ගැනිමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 3,828ක් වගාකර නොතිබුණි. | | |
| (ආ) | පාදුක්ක ගොවිජන සේවා කාරක සභාවේ 2021 හා 2022 මූල්‍ය ප්‍රකාශන අනුව කාබනික පොහොර නිෂ්පාදන වියදම පිළිවෙලින් රු.89,946ක් හා රු.1,040ක් වුවද, කාබනික පොහොර විකුණුම් ආදායමක් නිරීක්ෂණය නොවුණි. කැස්බෑව ගොවිජන සේවා කාරක සභාවේ 2021 සහ 2022 මූල්‍ය ප්‍රකාශන අනුව කාබනික පොහොර විකුණුම් අදායම පිළිවෙලින් රු.19,600ක් හා රු.424,900ක්ද එයට අදාල විකුණුම් පිරිවැය පිළිවෙලින් රු.15,260ක් හා රු.631,748ක් වුයෙන් පිළිවෙලින් දල ලාභය රු.4,340ක් හා රු.206,848ක විශාල වෙළඳ අලාභයක් නිරීක්ෂණය විය. නමුත් කාබනික පොහොර නිෂ්පාදන ඒකකයක ඇස්තමේන්තුගත හා සත්‍ය නිෂ්පාදන පිරිවැය හදුනාගත හැකිවන පරිදි තොරතුරු ලේඛනගත කර නොතිබුණු බැවින් ඒකකයක අපේක්ෂිත නිෂ්පාදන පිරිවැය හා සත්‍ය පිරිවැය හඳුනාගත නොහැකි විය. කෙසේ වුවත් වෙළඳ පල මිල මත පදනම්ව කි.ගෑ. 20ක ඇසුරුමක් රු.700 බැගින් අලෙවිකර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | ආදායම් වියදම් වෙන වෙනම හදුනාගත හැකි පරිදි කාබනික පොහොර නිෂ්පාදන ගිණුමක් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 03ක 2021 හා 2022 වර්ෂ සඳහා ගෙවත්ත සංවර්ධනය කිරීම සඳහා රු.100,043ක් හා රු.519,787ක් වියදම්කර තිබුණද ගෙවතු ආදායම පිළිවෙලින් රු.16,483ක් හා රු.50,060ක් පමණක් වූ අතර හෝමාගම ගොවිජන සේවා කාරක සභාව විසින් 2021 හා 2022 වර්ෂ සඳහා ගෙවත්ත සංවර්ධනය කිරීම සඳහා රු.8,160ක් හා රු.21,150ක් දරා තිබුණද කිසිදු ගෙවතු ආදායමක් රැස් කර නොතිබීම මත ගෙවතු සංවර්ධනයට දරන ලද වියදමට සාපේක්ෂව ගෙවතු ආදායම අවම අගයක් ගෙන තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | වියදමට සරිලන ප්‍රතිලාභ ලබාගැනිමට හැකිවන පරිදි විධිමත් සැලසුම් මත වියදම් දැරීම සිදු කළ යුතුය. |
| (ඇ) | 1977 වර්ෂයේ ආරම්භ කර ඇති කෝට්ටේ ගොවිජන සේවා මධ්‍යස්ථානය පිහිටා ඇති ගොඩනැගිල්ල හා භූමියෙහි අයිතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර | ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් පවරාදී නොමැති බව | මධ්‍යස්ථානයට අයත් ඉඩම පවරාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. එමෙන්ම කහතුඩුව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ඉඩම තාවකාලිකව පොලිස් ස්ථානය සඳහා පවරාගෙන තිබුණ අතර විවිධ අවස්ථාවල අදාල පාර්ශව අතර ලිපි හුවමාරු වී තිබුණද එම ඉඩම කහතුඩුව ගොවිජන සේවා මධ්‍යස්ථානයට ආපසු පවරා දී නොතිබුණි. තවද, කහතුඩුව ගොවිජන කේන්ද්‍රය ඉදි කිරීම සඳහා කහතුඩුව කනිෂ්ඨ විදුහල් ක්‍රීඩා පිටිය ලෙස පාවිච්චි කරන ඉඩමෙන් පර්චස් 30ක බුක්තිය කහතුඩුව ගොවිජන සේවා කාරක සභාවේ විධායක ලේකම්ට භාර දී තිබුණද, සමාලොචිත වර්ෂය අවසානය දක්වාම එම ඉඩම පවරා ගැනීම සිදුකර නොතිබුණි. | | |
| (ඉ) | කැස්බෑව ගොවිජන සේවා මධ්‍යස්ථානය සතුව අලෙවිසැල් 11ක් ඇති අතර එම අලෙවිසැල්වලට අදාලව එළඹි බදු ගිවිසුම්වල බදු කාලසීමාව 2020 සහ 2021 වර්ෂවලදී අවසන්වී තිබුණද ගොවිජන සේවා මධ්‍යස්ථානය හා බදු කරුවන් අතර නව බදු ගිවිසුම් ඇතිකර ගැනීමට හෝ පැවති ගිවිසුම දීර්ඝකර ගැනීමට හෝ කටයුතුකර නොතිබුණි. 2021 ජනවාරි 29 දින පැවති ගොවිජන සේවා කාරක සභා රැස්වීමේදී අලෙවිසැල් බදු කුලීය ඉහල දැමීමට තීරණය කළද එම තිරණයට අලෙවිසැල් පවත්වාගෙන යන ගොවි සංවිධාන එකඟ නොවීම නිසා අලෙවිසැල් 09ක් විසින් ගෙවීමට එකග වී ඇති පැරණි බදු ගිවිසුමේ ඇති මාසික කුලියද ගෙවීම් පැහැරහැර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට හිඟ කුලී ආදායම රු.860,064ක් නිරික්ෂණය වු අතර නව බදු ගිවිසුමක් නොමැතිවීම මත බදු ගැණුම්කරුවන් හිඟ කුලීය ගෙවීමකින් තොරව අලෙවිසැල්වලින් ඉවත්වුවහොත් එම හිඟ කුලීය අයකර ගැනීම ගැටළු සහගත විය හැකිය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | කාරක සභාවේ ආදායම් ඉපයීම් වැඩිකර ගැනිම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එනු ලබන ගොවිජන සේවා කාරක සභා 09ක රු.11,221,226ක්වූ ලැබිය යුතු ශේෂ 160 ක් අයකරගැනීමටත් රු.58,012,240ක්වූ ගෙවිය යුතු ශේෂ 198ක් නිරවුල් කිරිමටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරිමට හෝ විධිමත් අනුමැතියක් ලබාගෙන කපා හැරිමටද ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට හෝ විධිමත් අනුමැතියක් ලබාගෙන සමුච්චිත අරමුදලට ගැලපිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක 2022 වර්ෂ සඳහා ගොවි පැමිණිලි 136 ක් ලැබි තිබුණු අතර ඉන් පැමිණිලි 23ක්ද, 2021 වර්ෂයේදි ගොවිජන සේවා කාරක සභා 02 ක ලැබි තිබුණු පැමිණිලි 196කින් පැමිණිලි 28 ක් සඳහාද විසඳුම් ලබාදිමට නොහැකිව තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ගොවි පැමිණිලි සඳහා විසඳුම් ලබාදිමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය. |

## 3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ දී කොලොන්නාව ගොවිජන සේවා බල ප්‍රදේශයේ මාදම්ගහ කුඹුර නැමැති කුඹුරු ඉඩම හා 2018 වර්ෂයේදී හෝමාගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ කොස්ගහ කුඹුර නැමති කුඹුරු ඉඩම ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ ලිඛිත අවසරයක් නොමැතිව පස් පුරවා ගොඩකිරීම ආරම්භ කර තිබූ අතර එකී අවස්ථාවේදී සහ තවදුරටත් එම කුඹුරු ඉඩම් ගොඩකිරීම කරගෙන යාම අත්හිටුවීමට නීතිමය පියවර ගැනීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් කඩනම් පියවර ගෙන නොතිබීම මත වර්තමානයේ එකී කුඹුරු ඉඩම් සම්පූර්ණයෙන්ම ගොඩකර ගොඩනැගිලි ඉදිකර තිබීමෙන් අදාළ කුඹුරු ඉඩම් දෙක සහ ඊට යාබද කුඹුරු යලි කිසිදිනක වී වගා කළ නොහැකි තත්ත්වයකට පත්වී තිබුණි. එම තත්ත්වය එසේම තිබියදී කුඹුරු ඉඩම් ගොඩකිරීමට රුකුලක් දෙන අයුරින් ඉතාම වැරදි පූර්වාදර්ශයක් ලබා දෙන ආකාරයට මුලින් සඳහන් කර ඇති නිශ්චිත කුඹුරු ඉඩම් දෙක සඳහා රු.1,800,000 ක් | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ ලිඛිත අවසරයක් නොමැතිව පස් පුරවා ගොඩකර ගොඩනැගිලි ඉදිකිරිම මත ආරම්භ කරන නඩු කටයුතු පසුව කොළඹ දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් ඉදිරියට රැගෙන නොයා වන්දි මුදල් ලබා ගැනිම වැරදි පූර්වාදර්ශයක් නොවිමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. |

ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුවට පරිත්‍යාගයක් ලෙස ලබා ගෙන ඊට අදාළ නඩු කටයුත්ත ඉවත් කර ගෙන තිබුණි.

## 3.7 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 06ක ට්‍රැක්ටර් රථ 08ක් භාවිතයට නොගෙන නිශ්කාර්යව තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | වත්කම් භාවිතා කිරිමට නොහැකි තත්ත්වයේ පවති නම් එම වත්කම් අපහරණයට හෝ අලුත්වැඩියාකර භාවිතයට ගත හැකි නම් අලුත්වැඩියා කර භාවිතයට ගැනිමටද කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභාවක කෘෂි රසායනික ද්‍රව්‍ය රු.22,465ක්ද, ගොවිජන සේවා සේවා කාරක සභා 05 ක ගොවින් වෙත බෙදාදිම සඳහා ලැබී තිබුණු කාබනික දියර පොහොර ලිටර් 1302ක්, හා ජෛව දියර පොහොර ලිටර් 852ක් කල් ඉකුත්වි භාවිතයට ගත නොහැකි වී තිබුණි | කපා හැරිමට අනුමැතිය ඉල්ලා ඇති බව | දියර පොහොර කල් ඉකුත් විමට පෙර ගොවින් අතර බෙදාදිමට නොහැකි නම් වහාම පොහොර ලේකම් කාර්යාලය හරහා දියර පොහොර සැපයුම් සමාගම වෙත ආපසු හරවා යැවිමට කටයුතු කළ යුතුය. |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 09කට අදාලව කෘෂිකර්ම නිෂ්පාදන සහකාර වසම් 311කින් සමන්විත වන අතර, එයින් ගොවිජන සේවා කාරක සභා 08 ක වසම් 56ක් සඳහා කෘෂිකර්ම නිෂ්පාදන සහකාරවරුන් 56ක පුරප්පාඩු පැවතුණි. තවද, කෝට්ටේ ගොවිජන සේවා සභාවට අදාලව වසම් 21ක් පවතින අතර අනුමත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් 21ක් සිටියද එම ගොවිජන සේවා කාරක සභාවට අයත් වී වගා කළ හැකි මුළු කුඹුරු ඉඩම් අක්කර. 5 රූඩ්. 5ක් ප්‍රමාණයම එක් වසමකට අයත්ව පැවතුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | වසමක් තුළ ක්‍රියාත්මක කුඹුරු ඉඩම් හා අනෙකුත් වගා කටයුතු අනුව අවශ්‍ය කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් සංඛ්‍යාව සංශෝධනයට හෝ පුරප්පාඩු පිරවිමට හෝ කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 මැයි 04 දිනැති අංක 107 (සංශෝධන 2) දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුළත විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළයුතු වුවත් 2019, 2020, 2021 හා 2022 වර්ෂයේ ගොවිජන බැංකු මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ගොවිජන බැංකු 04ක රු.887,965 ක ණය මුදල් අයකර ගැනීමට නොහැකිව ණයකරුවන් 39ක් විනිශ්චය සභාව වෙත යොමු කර තිබුණු අතර ගොවිජන බැංකු 02 ක මිය ගොස් ඇති ණයකරුවන් 08 දෙනෙකුට අදාලව රු.249,315ක් අයකරගත නොහැකිව පැවතුණි. | නඩු විභාග වෙමින් පවතින බව ගොවි බැංකුවක් දන්වා ඇති අතර අනෙක් ගොවි බැංකු විසින් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි | ණය අයකර ගැනිම සඳහා අවශ්‍ය සියළුම ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගොවිජන බැංකුවක වර්ෂ ගණනක සිට පැවත එන චක්‍රීය අරමුදල් පාලන ගිණුම රු.287,171ක් හා චක්‍රීය අරමුදල් පොළී පාලන ගිණුම රු.689,507ක ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොමැති අතර ණය අයකර ගත නොහැකි වීම හේතුවෙන් 2010 වර්ෂයෙන් පසු පොළී ගණනය නතර කර ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රකාශන අනුව චක්‍රීය අරමුදල් පොළී පාලන ගිණුමට අදාලව ණයගැතියන්ගේ ශේෂ 66 ට අදාලව රු.689,507ක අයවිය යුතු මුදලක් සඳහන් උපලේඛනයක් ඉදිරිපත්කර තිබුණි. එම උපලේඛනයේ සඳහන් කර තිබුණු අයවිය යුතු ණය ශේෂ තහවුරු කර ගැනීම සඳහා ණයගැති ලෙජර් ගිණුම් හෝ ලිපි ගොනු විගණනයට ඉදිරිපත් නොවුණි. | මේ සම්බන්ධව දිස්ත්‍රික් කාර්යාලයෙන් උපදෙස් ඉල්ලා ඇති බව. | ප්‍රමාණවත් තොරතුරු හා ලේඛන පවත්වාගෙන යායුතු අතර ණය ලබාදීම හා අයකරගැනිම විධිමත් කළයුතුය. |
| (ඇ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2012 පෙබරවාරි 29 දිනැති චක්‍රලේඛ අංක 04/2012 හි 4.4.1 (iii) පරිදි කොටස් විකිණීම සිදුකළ නොහැකි අතර කොටස් පැවරීම සිදු කළ හැකිය. කොටස්හිමියා මියගිය විට කොටස්වල අනුප්‍රාප්තිකයා කොටස්කරුවා විසින් නම් කර | ඉදිරියේදි සොයා බලා කටයුතු කරන බව කහතුඩුව ගො.සේ.කා. සභාව දන්වා ඇති අතර විමර්ශනය අවසන් වු පසු මේ සම්බන්ධව කටයුතු කරන | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබිය යුතුය. එම අනුප්‍රාප්තිකයා කොටස්කරුවා ජීවත්ව සිටින කාලය තුළ වෙනස් කළ හැකි බව ද දන්වා තිබුණි. කෙසේ වෙතත්, ගොවිජන බැංකු 04ක මේ වන විට කොටස් හිමියන්ගේ ලැයිස්තුව තුළ සිටින පුද්ගලයන් මියයෑම හේතුවෙන්, අක්‍රිය කොටස් හිමියන් සිටින බව විගණනයට ප්‍රකාශ කළද, එවැනි කොටස්හිමියන් හඳුනා ගැනීම හා නිසි පරිදි යාවත්කාලීන කිරීමක් සිදු කර නොතිබුණි. මෙම කොටස් පැවරීමට අනුප්‍රාප්තිකයන් නම් නොකිරීම හේතුවෙන් එම ශේෂ නිරවුල් කොට සක්‍රීය කිරීමකින් තොරව, ඒ සඳහා පොලී ගණනය කරමින් ගිණුම්ගත කර පවත්වාගෙන ගොස් තිබුණි. | බව කොස්ගම ගො.සේ.කා. සභාව දන්වා ඇති අතර අනෙක් ගො. සේ. කා. සභාව විසින් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | |
| (ඇ) | ගොවිජන බැංකු 07ක මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කොටස් හිමියන්ගේ ශේෂ සාරාංශය, තැන්පත්කරුවන්ගේ ශේෂ සාරාංශය, ගොවි සංවිධාන ශේෂ සාරාංශය, කාන්තා ගොවි සංවිධාන ශේෂ සාරාංශය, ළමා තැන්පතු ශේෂ සාරාංශය හා කුඩා කණ්ඩායම් ශේෂ සාරාංශය යටතේ ඉදිරිපත් කර ඇති කොටස් හා තැන්පත්කරුවන් සංඛ්‍යාව සහ කොටස් හා තැන්පතු වටිනාකම් හා පොලී ගණනය කිරීමේ නිරවද්‍යතාවය තහවුරුකර ගැනීම සඳහා කේවල ශේෂ ලැයිස්තු ඉදිරිපත් නොකෙරුණි. එමෙන්ම ගණනය කරන ලද අදාල පොලී ප්‍රමාණයන් ජ’නල් සටහන් මගින් වාර්තා කර තිබුණද එයට අදාල ජ’නල් වවුචර් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදි සොයා බලා කටයුතු කරන බව කහතුඩුව ගො.සේ.කා. සභාව දන්වා ඇති අතර කේවල ශේෂ නඩත්තු කිරිම හා ජර්නල් වවුචර් ඉදිරිපත් කිරිම සඳහා මෙතෙක් උපදෙස් ලැබී නොමැති බව කොස්ගම ගො.සේ.කා. සභාව දන්වා ඇති අතර අනෙක් ගො. සේ. කා. සභාව විසින් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පාලන ගිණුම් ශේෂයන්ට අදාලව කේවල ශේෂ ලැයිස්තු පවත්වාගෙන යායුතුය. |